

# මගේ සිහිනය වුණේ සිනමා ගායකයකු වීමයි.

## නුවන් ගුණවර්ධන

නුවන් ගුණවර්ධන දශක කීපයක් පුරා හෙළ අඹරේ නොසැළී දිදුළන තාරකාවකි. බාල කාලයේ සිටම ගීත ගායනයෙහි විශිෂ්ට හැකියාවකට උරුමකම් කී නුවන්, ගී තරු අඹරට එක්වන්නේ රාත්‍රී සමාජ ශාලාවල හින්දි ගී ගායකයකු ලෙසිනි. කලක් ඇවෑමෙන් ප්‍රසංග වේදිකාවට නැතිවම බැරි ගායකයකු බවට පත්වූ නුවන් කෙටි කළකින්ම කැසට් ගී ලොවද ජය කෙහෙළි නැංවීමට සමත් විය.

එච්.ආර්. ජෝතිපාලගෙන් පසු සිංහල චිත්‍රපට පසුබිම් ගායනයේ ඇතිවූ රික්තය තුළ අතිශය සාර්ථකත්වයට පත් ගායන ශිල්පියා බවට පත්වූ නුවන් එදා මෙදා තුර චිත්‍රපට 60ක පසුබිම් ගී 200ක් පමණ ගායනා කර තිබේ. ඔහු ගායනා කළ බොහෝ ගී සදා නොවෙනස් රසික ප්‍රසාදයකට හිමිකම් කීම කලාකරුවකු ලබන දුර්ලභ වාසනා මහිමයක පලයකැයි කිව හැකිය.

නුවන් ගුණවර්ධන ගායන ශිල්පියා පසුගියදා සන්නස සහ තිසර ගුවන් විදුලිය හා පිළිසඳරකට එක්වූයේ මෙලෙසිනි.

**නුවන්, ඔබ කොහොමද ගී තරුවක් බවට පත්වුණේ?**

ඒක අහම්බෙන් හෝ එකවර සිදුවුණු දෙයක් නෙවෙයි. මට පුංචි කාලේ ඉඳලා ගායනයට සහජ හැකියාවක් තිබුණා. දෙමව්පියන්, ගුරුවර ගුරුවරියන් පවා ඒක දැනගෙන හිටියා. අපේ ගෙදරට නෑදෑයෙක් ආව වෙලාවට මට ඒ අය ඉදිරියේ ගීත ගායනයට අවස්ථාවක් ලැබෙනවා. පාසල් යන්න පටන් ගත්තට පස්සේ පාසලේ හැම ප්‍රසංගයකදිම මටත් ගීයක් ගයන්න අවස්ථාව අනිවාර්යෙන් ලැබෙනවා. පාසලෙන් අස්වෙලා මම ගුවන් සේවා සමාගමේ ඉංජිනේරු අංශයේ රැකියාවකට ආවා. එතනදි මට ඒ කාලේ ප්‍රවීණ ගායකයෙක් වුණු ඩෙරික්ද සිල්වා හමුවුණා. දවසක් ගුවන් යානය එනතුරු අපි විවේකාගාරයේ රැඳී සිටින අතරේ ගීත ගයන්න පටන් ගත්තා. ඩෙරික්ද සිල්වා තමයි ගායකයා. ඔහු සින්දු කියන අතරේ එක් අවස්ථාවක මට කිව්වා නුවන් ඔයත් සින්දුවක් කියන්නකෝ කියලා. මම දෝස්ති චිත්‍රපටියේ ''ජානේ වාලෝ සරා'' කියන ගීතය කිව්වා.

මම සින්දුව කියනකොට ඩෙරික් විශ්මිත වෙලා මගේ දිහා බලාගෙන හිටියා. සින්දුව ඉවර වුණා ගමන් මාව අල්ලගෙන බදාගෙන කිව්වා උඹ කොහෙද මිනිහෝ මෙච්චර කාලයක් හිටියේ. කැලේනේ ඉදලා තියෙන්නේ, බලන්ඩකෝ ඔයාගේ හැකියාව කියලා. මම ඔයාව ඉන්ටඩියුෂ් කරලා දෙන්නම් ෂෝමන් කෙනෙකුට කියලා කිව්වා. එදා ගුවන් යානය ආවට පස්සේ ඒකේ වැඩකටයුතු ඉවර වුණා ගමන්ම ඩෙරික් ඔහුගේ මදුරුවා ඉස්කූටර් එකේ මාව දාගෙන වැල්ලවත්තේ මැල්කම් ඇන්ඩ්‍රි කියන බර්ගර් ජාතික සංගීත සංදර්ශන සංවිධායකයා හමුවෙන්න ගියා. ඔහු තමයි ඒ කාලේ රාත්‍රී සමාජ ශාලාවල සංගීත ප්‍රසංග පවත්වන්නේ. ඊළඟ සතියේ කුරුණෑගල වැහැර රොසන්ටා ස්පෝර්ට්ස් ක්ලබ් ක්‍රීඩා සමාජයේ ප්‍රසංගයට ලෑස්තිවෙන්න කියලා ඔහු මට කිව්වා. ඒක තමයි මගේ පළවෙනි ප්‍රසංගය වුණේ.

**පළවෙනි ප්‍රසංගයේ අත්දැකීම මොනවගේ එකක්ද?**

එදා ඒකේ හිටියා ඩෙරික්ද සිල්වා, නොයෙලින් මෙන්ඩිස්, ෆරීනාලායි..... පැයක පැය එකහමාරක වගේ ප්‍රසංගයක්. මම හින්දි ගීත දෙකක් ගායනා කළා. ක්‍රිස්මත් චිත්‍රපටියේ මහේන්ද්‍ර කපූර් ගායනා කළ ''ලා කෝන් හේ යහා දිල්වාලේ'' කියන ගීතයත් මොහමඩ් රාෆිගේ ගීතයකුත් ගායනා කළා. මට ඉතා හොද ප්‍රතිචාරයක් ලැබුණා. මැල්කම් ඇන්ඩ්‍රි මා ලඟට ඇවිත් කිව්වා අදින් පස්සේ දිගටම ඔයා මගේ ආර්ටිස්ට් කියලා. එදා ඉදලා හැම සති අන්තයකම විවිධ ක්‍රීඩා සමාජ ප්‍රසංගවලට ඔහු මා සම්බන්ධ කළා. ඒ විදිහට රාත්‍රී සමාජ ශාලා ගායකයෙක් විදිහට තමයි මම ගීත ක්ෂේත්‍රයට ආවේ. ප්‍රසංග වේදිකාව තමයි මගේ ගීත ගායනයේ තිඹිරි ගෙය. ඒ වෙනකොට මගේ වයස අවුරුදු විසි එකයි.

**ගී තරුවක් වෙන්න කුඩා අවදියේ බලපෑ පසුබිම මොන වගේද?**

මම ඉපදුනේ කොළඹ. මහරගම තමයි මගේ ගම. පාසල් යන්නත් කලින් ඉදලා මම ගෙදරදි හඬ නගා ළමා ගීත ගායනා කරනවා. අම්ම තමයි මට ඒ ගීත පුරුදු පුහුණු කෙරුවේ. ''ලේනගේ පිට මැද ඉරි තුන ඇන්දේ කවුද අනේ අම්මේ'' වගේ ළමා ගීත මම මිහිරට ගයනවා. අපේ නෑදෑ හිතවතුන් ගෙදරට ආව වෙලාවට අම්මා මාව ඉදිරිපත් කරනවා. මේ බලන්නකෝ අපේ නුවන්ට හොදට සින්දු කියන්න පුළුවන්නේ කියලා. එතකොට කට්ටිය කියනවා නුවන් කෝ කියන්නකෝ බලන්න කියලා. මම මිහිරට කියනකොට ෂා කියලා අත්පොළසන් නාදේ එනවා. එතනින් තමයි මගේ සබකෝලය නැතිවුණේ.

ඊළඟට පාසල් කාලෙත් බලපෑවා. මම පාසල් ගියේ මහරගම බුවනෙකබා විද්‍යාලයට. පාසල් කාලේදි මුලින්ම මම පන්තියේ ගායකයා බවට පත්වුණා. යාලුවෝ වට කරගෙන මම පන්තියේ ඒක පුද්ගල ගී ප්‍රසංග පවත්වනවා. හින්දි ගීත. ජෝති ගීත. ධර්මදාස වල්පොල, මොහිදින් බෙග්, මිල්ටන් පෙරේරා ගායකයන්ගේ ගීතත් ඒ දවස්වල මම ගායනා කළා. මට කිසිම කෙනෙක්ගෙන් අභියෝගයක් තිබුණේ නෑ. මම තමයි අනෙක් අයට කියන්නේ හා දැන් ඔයත් කියන්නකෝ සින්දුවක් කියලා. එතකොට ඒ අය කියනවා අයියෝ ඔයාට වගේ නම් අපිට සින්දු කියන්න බෑ කියලා. අතීත ආත්මවලින් ගෙනාව පිනක්දෝ කොහෙද මට පුංචි කාලේ ඉදලම විශාල රසික ප්‍රසාදයක් ලැබුණා.

පස්සේ පාසලේ ගායකයා බවට පත්වුණා. පාසලේ තිබුණා මාසික ප්‍රසංගයක්. ඒකේ අනිවාර්යෙන්ම මගේ ගායනයක් ඇතුළත් වුණා. මම හඬ නගා දෝංකාර දෙන්න ගායනය කරලා හැමදාම පාසලේම ගායකයා බවට පත්වුණා. මගේ පාසලේ සංගීතය විෂයක් විදිහට තිබුණේ ඉතාම දුර්වල තැනක. ඒ නිසා මට පාසලේදි සංගීත අධ්‍යාපනයක් ලබන්න බැරිවුණා. පාසල් කාලයෙන් පස්සේ තමයි මම සංගීතය ඉගෙන ගන්න යොමුවුණේ.

සංවාද සටහන
ශ්‍රීලාල් සෙනෙවිරත්න

**ගායන ලෝකයට පිවිසෙන විට ඔබේ අරමුණ වුණේ මොකක්ද?**

මගේ සිහිනය වුණේ සිනමා ගායකයෙක්වීමයි. අද සිනමා ගායකයා ශත පහකටවත් ගණන් ගන්නේ නැතිවුණාට මම කුඩා කාලේ සිනමා ගායකයෝ තමයි ප්‍රධාන ගායකයෝ වුණේ. එදා මට අහන්න ලැබුණොත් සිනමා ගීත. එච් ආර් ජෝතිපාලගේ, ධර්මදාස වල්පොලගේ, මිල්ටන් පෙරේරාගේ, මොහිදින් බෙග්ගේ, මොහමඩ් රාෆි, කිෂෝර් කුමාර්, මුකේෂ් වැනි අයගේ ගායනා සිනමා පටයත් සමඟ රසවිදලා මට කුඩා කලෙදිම සිනමා ගායනය ගැන විශාල ආශාවක් ඇතිවෙලා තිබුණා. මගේ හඬෙත් ස්ක්‍රීන් වොයිස් එකකට අවශ්‍ය දේ තියන බව තරුණයෙක් වෙනකොට මට තේරුණා.

මම පාසලේ අධ්‍යාපනය ලබන අතරේ පාසල ඇරී මහරගම නැෂනල් සිනමා ශාලාවේ, අනූෂා සිනමා ශාලවේ දෙකයි තිහේ දර්ශණය බලන්න ගෙදරට හොරෙන් යනවා. පොතකුයි පැන්සලකුයි අරගෙන ගිහින් ගැලරියේ ඉදගෙන චිත්‍රපටියේ යන ගීත ලියාගන්නවා. මේ විදිහට ගීත ලියාගන්නට එක චිත්‍රපටිය හතර පස් වතාවක් නරඹනවා. සමහර දවස්වලට චිත්‍රපටිය නරඹන්න යන්නේ නැතිව සිනමා ශාලාවේ බිත්තිය අයිනට වෙලා ඉදගෙන සින්දු ලියාගන්නවා.

මේ විදිහට බාල කාලේ ඉදළම සංගීතයට හිත යොමුවීමෙන් අධ්‍යාපනයට බාධා සිදුවුණේ නැත්ද?
උසස් පෙළ දක්වා ඉගෙන ගත්තා. විශ්ව විද්‍යාලයට යන්න ඕනේ කියලා අදහසක් ඒ කාලේ මට තිබුණේ නෑ. උසස් පෙළෙන් පස්සේ පාසලෙන් අස්වෙලා පියාගේ මගපෙන්වීම අනුව රත්මලානේ තිබුණු ගුවන් පියසැරි පාසලේ ගුවන් යානා ඉංජිනේරු ශිල්පීය පාඨමාලාවක් හැදෑරුවා. මගේ ඉංග්‍රීසි අධ්‍යාපනයේ තිබුණු දක්ෂතාව නිසා ගුවන්යානා සැකිල්ල පිළිබඳ, අභ්‍යන්තර ව්‍යුහය පිළිබඳ, ගුවන්ගතවීම පිළිබඳ, එන්ජිම පිළිබඳ සියල්ල හදාරා රැකියාවක් කරන්නත් මට අවස්ථාව ලැබුණා. ලංකා ගුවන් සේවයේ ටේම්පරි ටෙක්නිෂියන් කෙනෙක් හැටියට තමයි මුලින්ම රැකියාවක් ලැබුණේ. පසුව එහිම ගුවන්යානා යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පියෙක් හැටියට වසර දහයක් පමණ රැකියාව කළා.

**ගී තරු අතරට ඔබගේ ආගමනය සිදුවෙන්නේ හින්දී ගී ගායනයෙන්. කොහොමද මේක සිංහලට කඩා ගත්තේ?**

රැකියාවට ගියාට පස්සේ කාලේ මට පඩියකුත් ලැබෙන නිසා මමම වියදම් කරලා අසූව දශකයේ මුල් කාලයේ සිංහල ගීත හතරක් පටිගත කළා. පාවී ගියාවේ ළදේ මා ඔබේ, පාසල් සමයේ, ඈත මූදෙන් එහා, ඇගේ පෙමයි කියන ගීත හතර. ඒ ගී හතර මම ගුවන් විදුලි සංස්ථාවට බාරදීලා ප්‍රචාරය කරවා ගත්තා. ඒ තමයි මම මුලින්ම ගැයූ සිංහල ගී.

**ඔබ ගයන බොහොමයක් ගී ඔබේම පද රචනා වෙන්නේ ඇයි?.**

ඒකත් මගේ තිබුණ විශේෂ හැකියාවක්. මට සිංහල භාෂාව ගැන හොද දක්ෂතාවක් හැකියාවක් තියනවා. මගේ තාත්තගේ සහෝදරයා අමර ශ්‍රී ගුණවර්ධන කුමාරතුංග මුණිදාසයන්ගේ පළවෙනි ගෝලයා. හෙළ හවුලට අපේ පවුලේ සම්බන්ධයක් තිබුණා. පාසල් යන කාලේ ඉදළා මට ගීත ලිවීමේ හැකියාවත්, තනු නිර්මාණය කිරීමේ හැකියාවත් තිබුණා.

**ප්‍රවීණ ගීත රචකයන්ගේ දායකත්වයක් ලබාගන්න ඔබ අකමැතිද?**

අවශ්‍ය තැනදි ලබාගන්න පැකිලෙන්නේ නෑ. මුලින්ම මම ගීත හතරකට තනු නිර්මාණය කරළා තුනකට සිංහල පද රචනා කළා. අනෙක් තනුවට සුනිල් චන්ද්‍රකුමාර කියලා හින්දි භාෂා ප්‍රවීණයෙක්ගෙන් හින්දි පද රචනාවක් කර ගත්තා. ''සාති හමාරේ ලයේ ප්‍යාරමේ කුෂියෝක කලියා කිලේ...'' මේක පටිගත කරන්න ගිය වෙලාවේ ශබ්දාගාරයේදී ලාල් තේනබදු කිව්වා නුවන් මේක සිංහලෙන් කළා නම් හොදයි ගුවන් විදුලියේ ප්‍රචාරය කරන්න පුළුවන් කියලා. මම කිව්වා හදිස්සියෙන් පද රචනාවක් කරන්න නම් මට බෑනේ කියලා. ලාල් කිව්වා කුලරත්න ආරියවංශට කිව්වා නම් ටක් ගාල ලියයි. එයා හොද දක්ෂයෙක් කියලා. මම කැමති වුණා.

ඒ වෙලාවෙම ලාල් ඔහුගේ මෝටර් සයිකලයෙන් ගිහින් කුලරත්න ආරියවංශව ශබ්දාගාරයට එක්ක ආවා. ඔහු තනුව අහලා ක්ෂණිකව පද රචනාවක් ලිව්වා. ඒක තමයි අදටත් ප්‍රසංග වේදිකාවෙදි රසික රසිකාවියන් කෑ ගහලා ඉල්ලන ''පාවී ගියාවේ ළදේ මා ඔබේ ගීතය''. මොන විශ්මිත ගණ පිහිටුවීමක්ද මන්දන්නේ නෑ ඒ ගීතය තරම් මගේ වෙන කිසිම ගීතයක් ජනප්‍රිය වුණේ නෑ කියලා කියන්න පුළුවන්.
ඔබට හින්දි ගී සහ හින්දි භාෂාව පිළිබඳ විශේෂ ඇල්මක් සහ දැනුමක් ඇතිවුණේ කොහොමද?
හින්දි චිත්‍රපටි බැලීමෙන් තමයි මුලින්ම ඒ ආශාව ඇති වුණේ. හින්දි භාෂාවට ඇතිවුණ ඇල්ම නිසාම පසුව මම පොත් සාප්පුවකින් හින්දි ගුරු කියලා පොතක් මිලදී අරගෙන හින්දි ඉගෙන ගන්න පටන් ගත්තා. අදටත් මගේ ළග ඒ පොත තියනවා. ඔය අතරවාරේ ගුවන් යානා ඉංජිනේරු ශිල්පය සම්බන්ධයෙන් මට ඉන්දියාවේ යන්න යම් අවස්ථාවකදි සිදුවුණා. බොම්බාය, බැංගලෝරය, මැඩ්රාස්වල වැඩ කරද්දි හමුවෙන හින්දි අය සමඟ මුලින්ම කැඩිච්ච හින්දියෙන් කතා කරලා කතා කරලා අන්තිමේ හොද හින්දියෙන් කතා කරන්න පුළුවන් තත්ත්වයට මම ආවා.

හින්දි ගීත ගායනයේදී එහි අර්ථය දැනගෙන ඊට අනර්ථයක් නොකර ගයන්න ඒකෙන් මට හැකියාව ලැබුණා. ලෝකයේ රටවල් තිස් පහක පමණ ප්‍රසංගවලට මම සහභාගි වෙලා තියනවා. ඒ හැම රටකදීම මට ශ්‍රී ලංකිකයන්ට වඩා මුණගැහිලා තියෙන්නේ හින්දි අය. ඒ හැම ප්‍රසංගයකදීම හින්දි ගී ගායනයෙන් ඉතාම සාර්ථක වෙන්න මට පුළුවන් කම ලැබිලා තියනවා. හින්දි අයගේ විශේෂ අගේ කිරීම්වලට ලක්වෙලා තියනවා.

**ඉන්දියාවේදි හින්දි ගායන ශිල්පීන් ඇසුරටත් පත්වුණාද ?**

ඇත්තෙන්ම මම හරි ආශාවෙන් හිටියා මොහමඩ් රාෆි, ක්‍රිෂෝර් කුමාර් වගේ ගායකයන් මුණගැහෙන්න. දකින්න. නමුත් ඉන්දියාවෙදි මට ඒ අවස්ථාව ලැබුණේ නෑ. නමුත් මට අවස්ථාවක් ලැබුණා මගේ සිහින කුමාරයන් බවට පත්ව සිටි ප්‍රසිද්ධ ප්‍රවීණ නළුවන් අතරින් රාජේන්ද්‍ර කුමාර් මැයි දින ප්‍රසංගයකට ලංකාවට ආව වෙලාවකදි මුණගැහෙන්න. ආනන්ද වික්‍රමසිංහ කියන සිනමා-වේදියා තමයි මට ඒ සම්බන්ධතාව හදලා දුන්නේ. ඔහුගේ ප්‍රසංගයේදී මටත් ගායනා කරන්න අවස්ථාව ලැබුණා. ඔහු මාව හදුන්වා දුන්නේ ඉන්දියාවේ සහ ලංකාවේ සහෝදරත්වය වෙනුවෙන් නුවන් ගුණවර්ධන කියලා. එහිදී මම